# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ කාර්යසාධනය ඇගයීම



පටුන


1. විධායක සාරාංශය 3

2. හැඳින්වීම 5

2.1 ආයතන ව්‍යුහය 5

2.2 පසුබිම 5

2.3 මූලික කාර්යයන් 5 - 6

2.4 විගණනය සඳහා අධිකාර බලය 6

2.5 විගණනයේ අවශ්‍යතාවය හා මාතෘකාව තෝරා ගැනීමට හේතු 6 - 7

2.6 විගණනයේ අරමුණු 7

2.7 විගණන විෂයපථය 7 - 8

2.8 සීමා කිරීම්,විරල බැහැරවීම් සහ ප්‍රතිකර්ම 8

2.9 විගණන නිර්ණායක 8

3. විස්තරාත්මක විගණන නිරීක්ෂණ 8

3.1.කොමිෂන් සභාවේ පසුබිම. 8

3.1.1 ස්ථාපිත කිරීම සංයුතිය හා ධූර කාලය. 8

3.1.2 කොමිෂන් සභාවේ පිහිටීම හා ස්ථානගත වීම 9

3.1.3 මානව සම්පත් කළමනාකරණය 9 - 11

3.1.4 කොමිෂන් සභාව පනත අනුව ක්‍රියාත්මක වීමේ මට්ටම 11

3.1.5 ආයතනයේ අභ්‍යන්තර සැලසුම් හා සේවාලාභියා වෙත ලබා දෙන මඟපෙන්වීම් 11-12

3.2 කොමිෂන් සභාවේ කාර්යයභාරය ඉටුකිරීම 12

3.2.1 පැමිණිලි භාරගැනීම හා ප්‍රතික්ෂේප කිරීම 12 - 13

3.2.2ආයතනය තුළ පැමිණිලි විමර්ශනය කිරීමේ වැඩ පිළිවෙළ 13 - 14

3.2.3 පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යක්ෂමතාවය 15 - 16

3.2.4. කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දීම 16 - 19

3.2.5. කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශවල ප්‍රගතිය 19 - 20

4. විගණන නිර්දේශ 20 - 22

5. ඇමුණුම් 23 - 24

## 1. විධායක සාරාංශය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි මූලික මිනිස් අයිතිවාසිකම්යනු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස, ආගමික නිදහස, වධහිංසාවලින් නිදහස , නීතිය ඉදිරියේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම , අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස ,අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම, භාෂණයේ,රැස්වීමේ, සමාගමයේ රැකියාවේ සහ යැම් ඊම් යනාදියේ නිදහස, තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිවාසිකම ආදිය වේ. මෙම පිළිගත් මූලික අයිතිවාසිකම් කඩවීම් හා කඩවීමට අත්‍යාසන්න අවස්ථාවලදී, ශ්‍රී ලංකාපුරවැසියන්ට පැමිණිලි කළ හැකි ආයතනය ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාපිත එකම ආයතනය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව මානව හිමිකම් සුරැකීමට කැපවී කටයුතු කිරීම ශක්තිමත් කිරීමත්, ජාත්‍යන්තර ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට පවරා ඇති රාජකාරි හා පොරොන්දු ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාවට නැංවීමත්, 1996 දී ශ්‍රී ලංකා රජය විසින් ප්‍රංශ මූලධර්ම යටතේ සකස්කරන ලද තත්ත්වයන් පවත්වා ගැනීමත් වෙනුවෙන් 1996 අංක 21 දරන පනත මඟින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. රටේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමට පිහිටුවා ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවකි.

මානව හිමිකම් උල්ලංඝනය වීම තුළින් මහජනතාවට සමාජය තුල සමාන හා සාධාරණ අවස්ථාවක් අහිමිවීමෙන් විවිධාකාරයේ ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වේ. පුද්ගලයින්ගේ මානව හිමිකම් උල්ලංඝනය වන අවස්ථාවන්හිදී මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ දැනුවත් භාවයක් ඇති පිරිස් පැමිණිලි ඉදිරිපත් කරයි. මෙකී පැමිණිලි ඉදිරිපත් කළ විට ඒ සඳහා නිර්දේශ ලබා දීමට දිගු කාලයක් ගත වීමද, පැමිණිලි විභාග කර ලබා දෙන නිර්දේශ ආයතන විසින් ක්‍රියාත්මක නොකිරීමද හේතුවෙන් ඒ සඳහා බලපාන ලද හේතූන් පිළිබඳ ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදී.

මෙම විගණනයේ අරමුණ වූයේ ශ්‍රී ලාංකිකයින්ගේ මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලද මොහොතේ සිට එය විභාග කර අදාල පාර්ශවයන්ට නිර්දේශයක් ලබා දුන් පසු එය ක්‍රියාත්මක වීම දක්වා වන අදියරයන් සම්බන්ධ ක්‍රමවේදයේ කාර්යසාධනය ඇගයීමයි.මෙහිදී ශ්‍රී ලංකා පොලිසිය , අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ලබාදුන් නිර්දේශ පමණක් සලකා බලන ලදී.

මෙහිදී හඳුනාගත් ප්‍රධාන විගණන නිරීක්ෂණය වූයේ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍ය ඉටුකිරීමෙහිලාපුරප්පාඩු පවතින තනතුරු වල අනුමත තනතුරු 118 න් 98 ක්ම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් 2015, 2016, 2017 හා 2018 වර්ෂවල අවසානයට විමර්ශන

කටයුතු අවසන් නොවූ ලිපිගොනු සංඛ්‍යාව 3576 , 5710, 10201ක් හා 8812ක් වී ඇති බවත් පැමිණිලි වලට විසඳුම් ලබා දීමට වර්ෂ 2 සිට 6 දක්වා දිගු කාලයක් ගතව තිබුණු බවත්ය.

1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(8) ජේදය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් දෙනු ලබන නිර්දේශ අදාල කාලය තුල කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැරහැර ඇති අවස්ථාවක හෝ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියාමාර්ග කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක කොමිෂන් සභාව විසින් ඒ කරුණු පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේද පනතේ දුර්වලතා සඳහන් කර ඇතත් 1996 වර්ෂයේ සිට පනත සංශෝධන කිරීමට කටයුතු කර නොතිබුණි.

කොමිෂන් සභාවේ පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යයෙහි නියුතු පරීක්ෂණ හා විමර්ශන අංශයට අදාල නීති නිලධාරී තනතුරු 22 න් 21 ක් හා මානව හිමිකම් නිලධාරී තනතුරු 47 ම පුරප්පාඩුව පැවතීම නිර්දේශ ලබා දීම ප්‍රමාද වීමට බලපා තිබුණි.1996 අංක 21දරන කොමිෂන් සභා පනතේ 30 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සියළු කටයුතු පිළිබඳ තොරතුරුද, කොමිෂන් සභාව වෙත යොමු කරන ලද සියළු කාරණාවල ලැයිස්තුවක්ද ,ඒ කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඇතුළත් කර වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.තවද කොමිෂන් සභාව විසින් දෙනු ලබන නිර්දේශ අනෙකුත් ආයතන සඳහා බලපාන නීතිරීති සමග නොගැළපෙන අවස්ථා හා සමගාමී පරීක්ෂණ පවත්වන ආයතනවල නිර්දේශ සමග ගැටෙන අවස්ථා ද නිරීක්ෂණය විය.

අපගේ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම මඟින් ,ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමාජයට වඩා උසස් ගුණාත්මක සේවාවක් ඉටු කරනු ලබන කාර්යක්ෂම හා ඵලදායි ආයතනයක් බවට පත් කිරීමට හැකි බව අපගේ නිරීක්ෂණය වේ.

## 2. හැඳින්වීම

### 2.1 ආයතන ව්‍යුහය

ශ්‍රී ලංකාව තුල මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෙකු ලෙස රට තුල මානව හිමිකම් සුරැකීමට කැපවී කටයුතු කිරීම සවිබල ගැන්වීමත්,ජාත්‍යන්තර ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවට පවරා ඇති කාර්ය භාරයන් හා ගිවිසුම්ගත ප්‍රඥප්තීන් ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියාත්මක කිරීමටත් 1996 දී ශ්‍රී ලංකා රජය විසින් ප්‍රංශ මූලධර්ම යටතේ සකස් කරන ලද තත්ත්වයන් පවත්වා ගැනීම යන අරමුණු පෙරදැරි කර ගෙන 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට වගකියන ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස ක්‍රියාත්මක වීමට ප්‍රතිපාදන සලසා ඇත. කොමිෂන් සභාවේ ප්‍රධාන කර්තව්‍යයක් වන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාව තුල පරීක්ෂණ හා විමර්ශන ලෙස වෙන් වූ අංශයක් ස්ථාපිත කර ඇත.

### 2.2 පසුබිම

නීතියේ ආධිපත්‍ය කෙරෙහි ඇති ගරුත්වය ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සෑම පුරවැසියකුගේම මානව හිමිකම් ආරක්ෂා කිරීම කොමිෂන් සභාවේ දැක්ම වේ. ජාත්‍යන්තරව පිළිගෙන ඇති මානව හිමිකම් ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙසින් මානව හිමිකම් ආරක්ෂා වන ආකාරයෙන් වඩාත් හොඳ මානව හිමිකම් සංස්කෘතියක් බිහිකිරීම සඳහා ,සියල්ලන්ගේම මානව හිමිකම් සුරක්ෂිත කිරීම සහ වැඩිදියුණු කිරීම උදෙසා ක්‍රියාත්මක වන්නා වූ සියළුම කොටස්කරුවන්ගේ සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති සියළු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත්, ජාතික නීති සහ පිළිවෙත් ජාත්‍යන්තර නීතීන් සහ සම්මුතිවලට අනුකූල වන ලෙස සකස්කිරීමට රජයට මගපෙන්වීමත් ,මානව හිමිකම් පිළිබඳ දැනුම දිවයින පුරා ජීවත්වන සියළුම පුද්ගලයින් අතර ප්‍රචලිත කිරීමත් කොමිෂන් සභාවේ ප්‍රධාන පරමාර්ථ වේ.

### 2.3 මූලික කාර්යයන්

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේiii වැනි පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් පිළිබඳව සඳහන් වේ. මෙම පිළිගත් මූලික අයිතිවාසිකම් කඩවීම් සහ කඩවීමට අත්‍යාසන්න අවස්ථාවලදී , ශ්‍රී ලාංකීය පුරවැසියන්ට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළ හැකි අතර ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පිළිගත් පුරවැසියන්ගේ

ඕනෑම මූලික අයිතිවාසිකමක් පුරවැසියන්ට සාක්ෂාත් කර දීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ. ඒ අනුව කොමිෂන් සභාවේ මූලික කාර්යයන් පහත පරිදි විය.

(අ) මූලික අයිතිවාසිකම්වලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම,

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත් කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම,

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ ,ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම,

(ඈ) ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වලට ,නියමයන්ට හා සම්මතවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම,

(ඉ) මානව හිමිකම් ක්ෂේත්‍රයේ දී ගිවිසුම්වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායකවීමේ හා එකඟවීමේ අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම, සහ

(ඊ) මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම හා මානව අයිතිවාසිකම්වලට අනුකූලව අධ්‍යාපනයක් සැලසීම.

## 2.4 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.5 විගණනයේ අවශ්‍යතාවය හා මාතෘකාව තෝරා ගැනීමට හේතු

මානව හිමිකම් උල්ලංඝනය වීම තුලින් මහජනතාවට සමාජය තුල සමාන හා සාධාරන අවස්ථාවක් අහිමිවීමෙන් සමාජයෙන් කොන්වීමත් ඒ තුලින් ආත්ම විශ්වාසය බිඳවැටීමත්,සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වීමත් සිදු වේ.

මහජනතාව විසින් මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කල විට නිර්දේශ ලබා දීමට වැඩි කාලයක් ගත වීමද, පැමිණිලි විභාගකර ලබා දෙන නිර්දේශ අදාල ආයතන විසින් ක්‍රියාත්මක නොකිරීමද හේතුවෙන් මහජනතාවට සාධාරණය ක්‍රියාත්මක නොවන බවටද මහජනයා අතර මතයක් ගොඩ නැගෙමින් පැවතීම හේතුවෙන් මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදී.

## 2.6 විගණනයේ අරමුණ

විගණනයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුල මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනයවීමට අත්‍යාසන්න අවස්ථාවලදී ඒවාට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඍජු ක්‍රියාකාරී මැදිහත් වීම හා ඔවුන් විසින් ලබා දෙනු ලබන නිර්දේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ කාර්යසාධනය පිළිබඳව පරීක්ෂා කිරීමයි.

## 2.7 විගණන විෂයපථය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ කාර්යසාධන විගණනය සිදු කරන ලද අතර අපට අවශ්‍යයැයි සැලකෙන පරීක්ෂණයන්ද ඊට ඇතුළත් විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හරයාත්මක කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් හා එහි පැමිණිලි හා විමර්ශන අංශයේ හඳුනාගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් පවත්නා අවදානම් හා අභියෝග පිළිබඳව අවබෝධයක් අප විසින් ලබාගත් අතර , කාර්යසාධන විගණනයේ සොයා ගැනීම් හා නිර්දේශයන් පිළිබඳව නිගමනවලට එළඹෙන ලදී . මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී.

(අ) අප විසින් ප්‍රමාණාත්මක යැයි සලකණු ලැබූ සහ ඒ පිළිබඳ සාධාරණ නිගමනයන් ඇති කර ගැනීමට අපට හැකි වන පරිදි අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අප විසින් ක්‍රියා කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූලික කාර්යය ඉටුකිරීමෙහිලා කොමිෂන් සභාව වෙත ලැබී තිබුණු පැමිණිලිවල ප්‍රමාණය හා ස්වභාවය මත පදනම්ව අවස්ථාවෝචිතව අපගේ විගණන පටිපාටිවල ප්‍රමාණය හා ස්වභාවය වෙනස් වුණි. අපගේ විගණන පටිපාටිවලට විමසීම්, පරීක්ෂා කිරීම් හා නිර්දේශයන්ට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීමද ඇතුළත් විය.

(ආ) අපගේ විෂයපථය ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රධාන රාජ්‍ය ආයතන 03 ක් සම්බන්ධයෙන්, (ශ්‍රී ලංකා පොලිසිය ,විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන අමාත්‍යාංශය) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලබා දෙන නිර්දේශ සම්බන්ධව පමණක් සීමා වූ අතර මෙම කාර්යය පළමුව සැලසුම් කර විගණන සැලැස්මකට සම්බන්ධ

කරන ලදී.කාර්යසාධන විගණනයේදී අපගේ සොයා ගැනීම් පදනම් කර ගෙන මෙය වෙනස් විය. ඒ අනුව අපගේ විගණන විෂය පථය විශේෂ අවස්ථා මත වෙනස් වී ඇත.

## 2.8 සීමා කිරීම්,විරල බැහැරවීම් සහ ප්‍රතිකර්ම

කාර්ය සාධන විගණනයේ ප්‍රමාණය, කාලය හා කාර්යය සඳහා ලබා ගත හැකි මානව සම්පත් මත පදනම් වූ නියැදි පටිපාටියකට සීමා විය. පැමිණිලි සඳහා නිර්දේශ ලබා දීමට වසර කීපයක් ගත වී ඇති බැවින් පමිණිල්ලේ සඳහන් දුරකථන අංක ඔස්සේ පැමිණිලිකරුවන් සම්බන්ධ කර ගැනීමේ අපහසුතාවක් පැවතුණි. කොමිෂන් සභාවෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයද, ඉදිරිපත් කරන තොරතුරු වෙනස් කිරීම්වලට භාජනය කර නැවත ඉදිරිපත් කිරීමද විෂය පථය සීමා කිරීමට හේතු විය.

## 2.9 විගණන නිර්ණායක

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(ආ) 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත

(ඇ) කොමිෂන් සභා නිර්දේශ හා ක්‍රියාත්මකවීමේ පරිපාටිය

(ඈ) ප්‍රගති සමාලෝචන වාර්තා / ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන වාර්ෂික වාර්තා

(ඉ) ක්‍රියාකාරී සැලසුම්

## 3. විස්තරාත්මක විගණන නිරීක්ෂණ

### 3.1.කොමිෂන් සභාවේ පසුබිම

### 3.1.1 ස්ථාපිත කිරීම , සංයුතිය හා ධූර කාලය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්දේශ මත, ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ. මානව හිමිකම් වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පලපුරුද්දක් ඇත්තා වූ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමන්විත වේ. එම සාමාජිකයින් අතුරෙන් එක් සාමාජිකයෙකු සභාපතිවරයා වශයෙන් ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකුම අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු වේ. මේ අනුව කටයුතු කරනු ලබන කොමිෂන් සභාවේ අරමුණු ඉටු කරගැනිම සම්බන්ධ විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 3.1.2කොමිෂන් සභාවේ කාර්යාලය ස්ථානගත කිරීම

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වර්තමානයේ "අංක 14, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 04"යන ස්ථානයේ කුලී ගොඩනැගිල්ලක වර්ග අඩි 28505 ක ස්ථාපිත කර ඇත. එම ගොඩනැගිල්ලේ වාර්ෂික කුලිය වශයෙන් 2016,2017 හා 2018 වර්ෂ සඳහා පිළිවෙලින් රු.35,880,000 ක් ,රු.36,144,000 ක් හා රු.36,432,000 ක් වැය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දෛනිකව මහජනයා විශාල වශයෙන් පැමිණෙන නමුත් එම ස්ථානයේ මහජනයාට වාහන නැවත්වීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොතිබුණු අතර පෞද්ගලික වාහන දෙකක් පමණක් නැවතීමේ පහසුකම් පැවතුණි.

(ඇ) එක් පසකට පමණක් වාහන ධාවනය වන මාර්ගයක මෙම කොමිෂන් සභාව ස්ථානගතව පවතින අතර කොමිෂන් සභාවට නිරන්තරයෙන් ශ්‍රී ලාංකීය ග්‍රාමීය ජනතාව පැමිණෙන බැවින් ඔවුන් නිරන්තරයෙන් ආයතනය පිහිටි ස්ථානය සොයා ගැනීමේ අපහසුතාවයට පත්ව තිබුණි.

(ඈ) මේ අනුව කොළඹ ඇතුළුව තදාසන්න ප්‍රදේශවල ජනයාට ආයතනය සොයා ගැනීම ගැටළුවක් නොවුවද ග්‍රාමීය ජනයාට ආයතනය සොයා ගැනීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී තිබුණි.මෙම නිසා සභාවේ කාර්යාලය ස්ථානගත කිරීමේදී මහජනතාවට විය හැකි අපහසුතාවයන් පිළිබඳ සලකා නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.1.3 මානව සම්පත් කළමනාකරණය

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 22(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත පැවරී ඇති කර්තව්‍යය ඉටුකිරීමෙහිලා කොමිෂන් සභාවට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් හා සේවකයන් පත්කරනු ලැබිය හැකි වුවත් 2019 ජුලි 31 දින වන විට කොමිෂන් සභාවේ තනතුරුවල පුරප්පාඩු 98 ක් පවතින බව නිරීක්ෂණය විය. විස්තර උපලේඛන 01 හි දක්වා ඇත.

(අ) අනුමත කාර්යමණ්ඩලය

කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පුරප්පාඩු පවතින තනතුරු වලට 118ක කාර්යමණ්ඩලයක් අනුමත කර තිබුණි. ඒ අතර කොමිෂන් සභාවේ මූලික කාර්යභාරයක් වන පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යයට සෘජුව සම්බන්ධ වන නීති නිලධාරීන් 22 දෙනෙක්ද මානව හිමිකම් නිලධාරීන් 47 දෙනෙක්ද ඇතුළත් වී තිබුණි.තවද කොමිෂන් සභාවේ කටයුතු මනා පාලනයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ තනතුරු 05 ක්ද අනුමත කර තිබුණි.

(ආ) කාර්යමණ්ඩලය බඳවා ගැනීම

කොමිෂන් සභාවේ මුළු කාර්ය මණ්ඩලයෙන් තනතුරු 98 ක් 2019 ජුලි 31 දිනට පුරප්පාඩුව පැවතුණි.කොමිෂන් සභාව සඳහා නිසි බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී නොතිබීම මේ සඳහා බලපා තිබුණි. මෙම කාර්යය සඳහා වසර ගණනාවක් ගතව තිබුණු අතර 2018 මැයි 17 වන දින බඳවා ගැනීමේ පටිපාටි සියල්ල අනුමත වී තිබුණි. අධ්‍යක්ෂ තනතුරු සඳහා වෙනත් සුදුසුකම් සමඟ කළමනාකරණ මට්ටමේ වසර 15 ක සේවා පළපුරුද්දක් ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා තිබුණි. එහෙත් ඒ සඳහා වසර 15 ක සේවා පළපුරුද්දක් ඇති කිසිදු අයදුම්කරුවකු නොමැතිවීමෙන් එම පුරප්පාඩුද පිරවීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි.

(ඇ) අධීක්ෂණය

පුරප්පාඩුව පැවති තනතුරු තුළ අනුමතව පැවති අධ්‍යක්ෂ තනතුරු 05 ම සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ම ඇතුළුව අනුමත විධායක ශ්‍රේණියේ තනතුරු 43න් 35ක්ම පුරප්පාඩුව පැවතුණි. එය මුළු විධායක ශ්‍රේණියේ තනතුරු වලින් සියයට 79ක ප්‍රමාණයක් ගෙන තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ කටයුතු විධිමත් අධීක්ෂණයකින් යුතුව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(ඇ) වැඩ පැවරීම

කොමිෂන් සභාවේ මූලික කාර්යභාරයක් වන පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යය පැවරී ඇති පරීක්ෂණ හා විමර්ශන අංශයට අදාල නීති නිලධාරී තනතුරු 22න් 21ක් ද , මානව හිමිකම් නිලධාරී තනතුරු 47මද පුරප්පාඩුව පැවතුණි. මෙම හේතුවෙන් නිසියාකාරව වැඩ පැවරීමට නොහැකි වී තිබුණු අතර වාර්ෂිකව කොමිෂන් සභාවට ලැබෙන පැමිණිලි විමර්ශනය කර අවසන් කිරීමට නොහැකි වී ඇති බවත්, සෑම වර්ෂයකම විමර්ශන කටයුතු අවසන් නොවූ ගොනු විශාල ප්‍රමාණයක් වර්ෂය අවසානයේ පවතින බවත් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂ හතර තුල විමර්ශන කටයුතු අවසන් නොවූ ගොනු ගණන පහත පරිදි විය.

| | **2015.12.31 දිනට** | **2016.12.31 දිනට** | **2017.12.31 දිනට** | **2018.12.31 දිනට** |
|---|---|---|---|---|
| විමර්ශන කටයුතු අවසන් නොවූ ගොනු ගණන | 3576 | 5710 | 10201 | 8812 |

පුරප්පාඩු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අදහස් දැක්වීම

කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීමට ප්‍රධාන හේතුව කොමිෂන් සභාව සඳහා බඳවාගැනීමේ පරිපාටි අනුමත වී නොතිබීම බලපා ඇති බවත් අවසාන වශයෙන් බඳවාගැනීමේ පරිපාටි 2018 මැයි 17 දින අනුමත වූ බවත් දක්වා ඇත.තවද සේවක අන්තර්ග්‍රහණයට අදාළ අවසන් උපදෙස් 2019 අගෝස්තු මාසය වනතෙක්ම ලැබී නොතිබුණු බැවින් බඳවාගැනීම් පරිපාටි ප්‍රකාරව ඉදිරි කටයුතු කළ නොහැකි වූ බවද දක්වා ඇත.

**3.1.4කොමිෂන් සභාව පනත අනුව ක්‍රියාත්මක වීමේ මට්ටම**

(අ) 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(8) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් දෙනු ලබන නිර්දේශයක් යම් අධිකාරියක් හෝ තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් , ඒ නිර්දේශයේ සඳහන් කාලය ඇතුළත, කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර , කොමිෂන් සභාවේ නිර්දේශ බලාත්මක කිරීම පිණිස ඔහු විසින් ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති ක්‍රියා මාර්ග, කොමිෂන් සභාවේ මතය අනුව ප්‍රමාණවත් නොවන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් ඒ කරුණු පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වන වගන්තිය අනුව කොමිෂන් සභාව විසින්, වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, වාර්තාව අදාල වන වර්ෂයේ කොමිෂන් සභාවේ සියළු කටයුතු පිළිබඳව ඒ වාර්තාවේ ඇතුළත් කළ යුතුය. තවද කොමිෂන් සභාව වෙත යොමු කරන ලද සියළු කාරණාවල ලැයිස්තුවක්ද,ඒ කාරණා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග ද ඒ එක් එක් කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඒ වාර්තාවේ ඇතුළත් විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 03 ක වාර්ෂික වාර්තා 2019 ඔක්තෝබර් 30දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.1.5ආයතනයේ අභ්‍යන්තර සැලසුම් හා සේවාලාභියා වෙත ලබා දෙන මඟපෙන්වීම්**

(අ) ආයතනයට පැමිණෙන මහජනතාවට දැනුවත්වීමට හා කොමිෂන් සභාවේ විමර්ශනය කරනු ලබන්නේ කුමන පැමිණිලිද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු ප්‍රදර්ශනය කර නොතිබුණි.තවද ආයතනය තුල විමර්ශන කටයුතු සිදුවන ස්ථාන හා එම ස්ථාන කරා ගමන් කළ හැකි ආකාරය පිළිබඳ මඟපෙන්වීම්දප්‍රදර්ශනය කර නොතිබුණි.

(ආ) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ලෙස හඳුනාගන්නා ලද කාර්යයන් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ඉටුකර මහජනතාවට උසස් සේවාවක් සලසා දෙනු පිණිස කොමිෂන් සභාව සැලැස්මක් සකස් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ඉටුකළ යුතු කාර්යයන් හඳුනා ගනිමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 3.2 කොමිෂන් සභාවේ කාර්යයභාරය ඉටුකිරීම

### 3.2.1 පැමිණිලි භාරගැනීම හා ප්‍රතික්ෂේප කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්ෂිකව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුළ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට ලද පැමිණිලි අතුරින් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වන බව පෙන්නුම් කරනු ලබයි.එනම් කොමිෂන් සභාව වෙත දිගින් දිගටම විෂය පථයට අදාළ නොවන පැමිණිලි ඉදිරිපත් වීමේ ප්‍රවණතාවයක් පවතී.ප්‍රධාන කාර්යාලය විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැමිණිලි 9298 ක් ප්‍රතික්ෂේප කර තිබුණු අතර විස්තර පහත වගුවේ දක්වා ඇත.

| | **2016** | **2017** | **2018** |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ පැවති පැමිණිලි සංඛ්‍යාව | **3576** | **5750** | **10241** |
| ලද පැමිණිලි සංඛ්‍යාව | 4970 | 7712 | 3389 |
| වර්ෂයේ මුළු පැමිණිලි | ---------<br>8546 | ----------<br>13462 | ---------<br>13630 |
| ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 2414<br>---------- | 2571<br>----------- | 4313<br>---------- |
| විසඳිය යුතු පැමිණිලි | 6132 | 1 08 91 | 9 3 17 |


(ආ) පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 10 න්ම තොරතුරු කැඳවා ඇතත් ප්‍රාදේශීය කාර්යාල 04 කින් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ප්‍රාදේශීය කාර්යාල 04 කට අදාල තොරතුරු පහත දක්වා ඇත.

| | **2016** | **2017** | **2018** |
|---|---|---|---|
| ප්‍රාදේශීය කාර්යාල 04 ක් සඳහා ලද පැමිණිලි සංඛ්‍යාව | 1991 | 1764 | 1414 |
| එම කාර්යාල 04 විසින් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 163 | 238 | 226 |

තවද කොමිෂන් සභාවේ ප්‍රාදේශිය කාර්යාලවලට ලද පැමිණිලිවලින් සිදු කරන ලද ප්‍රතික්ෂේප කිරිම් පිළිබද නිසි තොරතුරු විගණනයට නොලැබීම හේතුවෙන් අපගේ විෂය පථය තව දුරටත් සීමා විය. මෙලෙස දිගින් දිගටම විෂය පථයට අදාළ නොවන පැමිණිලි කොමිෂන් සභාව වෙත ලැබීමට හේතුවක් ලෙස කොමිෂන් සභාවේ විෂය පථයට අදාළ නොවන ආකාරය පිළිබඳව හා කොමිෂන් සභාවට අදාළ වන විෂය පථය පිළිබද මහජනයා ප්‍රමාණවත් පරිදි දැනුවත් නොකිරීම හේතු වී තිබුණි.

### 3.2.2 ආයතනය තුළ පැමිණිලි විමර්ශනය කිරීමේ වැඩ පිළිවෙළ

කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අදියරයන් කීපයක් යටතේ කටයුතු කරනු ලබන අතර අවසානයේදී නිර්දේශ නිකුත් කරනු ලබයි. නිර්දේශ නිකුත් කිරිමෙන් පසුනිර්දේශ ක්‍රියාත්මක විම සම්බන්ධයෙන් කොමිෂන් සභාව පසු විපරමක් සිදු කරනු ලබන අතර නිර්දේශ ක්‍රියාත්මක නොවිම් සම්බන්ධව වාර්තාවක් කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත යොමු කිරීමට නියමිතයි.පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අදියරයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.


පැමිණිලි භාර ගැනීම සහ ලියාපදිංචි කිරීම
පැමිණිල්ල අධ්‍යයනය කිරීම
විෂය පථයට අයත්
විෂය පථයට අයත් නොවන
විමර්ශනය කිරීම
22
පැමිණිල්ල ප්‍රතික්ෂේප කිරීම
පරීක්ෂණ පැවැත්වීම, සමථකරණය හෝ සමගි කිරීම
විසඳුනු පැමිණිලි
පැමිණිලිකරු / නියෝජිතයන්ට දැනුම්දීම
නොවිසඳුනු පැමිණිලි
පරීක්ෂණ වාර්තාව
නිර්දේශ නිකුත් කිරීම
පසු විපරම් කිරීම
ක්‍රියාත්මක නොවූ නිර්දේශ ජනාධිපතිවරයා වෙත යොමු කිරීම

(අ) කොමිෂන් සභාවට පැමිණිලි ලද විට කොමිෂන් සභාවේ විෂය පථයට අදාල නොවන පැමිණිලි ප්‍රතික්ෂේප කරන අතර විෂය පථයට අදාල වන පැමිණිලි ලියාපදිංචි කර අංකයක් ලබා දී කුවිතාන්සියක් නිකුත් කරනු ලබයි. ඉන් පසු පැමිණිල්ල පරිගණකගත කර අදාළ අංශ වෙත හා නිළධාරීන් වෙත යොමු කරනු ලැබේ. විමර්ශන නිළධාරීන් පැමිණිල්ලට අදාළ තොරතුරු කැඳවන අතර සිතාසි මගින් දෙපාර්ශවයම කැඳවනු ලැබේ.විමර්ශනයේ දී දෙපාර්ශවය එකග වන්නේ නම් සමථයකට පත් තරනු ලබයි.එසේ නොමැති නම් නිසි පරිදි විමර්ශනයක් සිදු කර විමර්ශන නිළධාරියා විසින් විමර්ශන වාර්ථාව සකස් කර පරීක්ෂණ හා විමර්ශන අංශයේ අධ්‍යක්ෂ වෙත යොමු කරනු ලැබේ.

(ආ) පරීක්ෂණ හා විමර්ශන අංශයේ අධ්‍යක්ෂ විසින් විමර්ශන වාර්ථාව අධ්‍යනය කර කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් විමර්ශන වාර්ථාව අධ්‍යනය කර සදොස් තැන් ඇත්නම් නිදොස් කරමින් නිර්දේශය ලබා දෙනු ලැබේ.මෙසේ දිගු කාර්යයකින් පසු ලබා දෙන නිර්දේශද ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

### 3.2.3 පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යක්ෂමතාවය

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2015 වර්ෂයේ පමණක් ලද පැමිණිලිවලින් 2015 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 3576 ක් ඉතිරි වී තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ප්‍රධාන කාර්යාලය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 16071 ක් විය. ඒ අනුව මුළු පැමිණිලි සංඛ්‍යාව 19647කි. එම පැමිණිලි වලින් විවිධ හේතූන් මත පැමිණිලි 9298ක් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව නිර්දේශ ලබා දීමට හෝ සමථයකට පත් කිරීමට ඉතිරි මුළු පැමිණිලි සංඛ්‍යාව 10349ක් විය. මෙම පැමිණිලි වලින් නිර්දේශ ලබා දීම, සමථයකට පත් කිරීම, අධිකරණය හා වෙනත් බලධාරීන් වෙත යොමු කළ සහ පැමිණිලිකරුවන් විසින් ඉවත් කර ගන්නා ලද පැමිණිලිවල එකතුව 1497ක් විය. තවදුරටත් විසදීම සඳහා ඉතිරි පැමිණිලි සංඛාව 8852කි.

(ආ) 2016 වර්ෂයේ නිර්දේශ ලබා දීමට තිබුණු පැමිණිලි 8546 න් 2414 ක් ප්‍රතික්ෂේප කර තිබූ අතර ඉතිරි පැමිණිලි 6132කින් නිර්දේශ 41ක් පමණක් ලබා දී තිබුණි. තවත් පැමිණිලි 83 ක් සමථයකට පත්කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම පැමිණිලි 187 ක් පැමිණිලි කරුවන් විසින් ඉවත්කර ගෙන තිබුණු අතර පැමිණිලි 71 ක් අධිකරණ හා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි.

(ඇ) 2017 වර්ෂය ආරම්භයේ පැමිණිලි 5750 ක් ඉතිරිව තිබුණු අතර 2017 වර්ෂය තුල පැමිණිලි 7712 ක් ලැබී තිබුණි. 2017 වර්ෂයේ විවිධ හේතූන් මත පැමිණිලි 2571 ක් ඉවත් කර තිබුණු අතර ඉතිරි පැමිණිලි 10891 න් පැමිණිලි 84 ක් සඳහා නිර්දේශ ලබා දී තිබුණි. තවත් පැමිණිලි 195 ක් ක් සමථයකට පත්කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම පැමිණිලි 346 ක් පැමිණිලි කරුවන් විසින් ඉවත්කර ගෙන තිබුණු අතර පැමිණිලි 25 ක් අධිකරණ හා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි.

(ඈ) 2018 වර්ෂය ආරම්භයේ පැමිණිලි 10241 ක් පැවති අතර 2018 වර්ෂය තුල පැමිණිලි 3389 ක් ලැබී තිබුණි. 2018 වර්ෂයේ විවිධ හේතූන් මත පැමිණිලි 4313 ක් ඉවත් කර තිබුණු අතර ඉතිරි පැමිණිලි 9277 න් පැමිණිලි 95 ක් සඳහා නිර්දේශ ලබා දී තිබුණි. තවත් පැමිණිලි 114 ක් සමථයකට පත්කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම පැමිණිලි 175 ක් පැමිණිලි කරුවන් විසින් ඉවත්කර ගෙන තිබුණු අතර පැමිණිලි 81ක් අධිකරණ හා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි. විස්තර උපලේඛන 02 හි දක්වා ඇත.


### 3.2.4 කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූලික කාර්යභාරයක් වශයෙන් සැලකෙන කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීමේදී ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවන බව නිරීක්ෂණය විය. 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල කොමිෂන් සභාව විසින් ලබා දී තිබුණු නිර්දේශ අතුරින් නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණු පැමිණිලිවලට අදාල නිර්දේශ ලබා දීම සඳහා ගත කර තිබූ කාලය පහතින් සාරාංශ කර දැක්වේ.

(අ) ශ්‍රී ලංකා පොලීසිය

කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ශ්‍රී ලංකා පොලීසිය වෙත නිර්දේශ 50ක් ලබා දී තිබුණු අතර ඉන් නිර්දේශ 45ක් ක්‍රියාත්මක වී නොතිබුණි. එම නිර්දේශ 45 ලබාදීම සඳහා කොමිෂන් සභාව ගත කර තිබුණු කාලය අවමය වසර 02 ක් වූ අතර උපරිමය වසර 06 කට වැඩි වී තිබුණි. විස්තර පහත වගුවේ දැක්වේ .

| කාල පරිච්ඡේදය | පැමිණිලිසංඛ්‍යාව | % |
| --- | --- | --- |
| වසර 2ට අඩු | 0 | 0 |
| වසර 2-4 අතර | 17 | 38 |
| වසර 4-6 අතර | 17 | 38 |
| වසර 6ට වැඩි | 11 | 24 |





ඉහතින් සදහන් කළ නිර්දේශ 45ම ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් වර්ෂ දෙකකට අධික කාලයක් ගත කර තිබුණි.. එම නිර්දේශ 45 න් නිර්දේශ 28 ක් ලබා දීම සඳහා වසර 04කට අධික කාලයක් කොමිෂන් සභාව විසින් ගත කර තිබුණි. ඒ අතර නිර්දේශ ලබා දීමට වසර 09 කට වැඩි කාලයක් ගත වූ පැමිණිලි 03 ක්ද විය. 1996 අංක 21 දරන පනත අනුව කොමිෂන් සභා සාමාජිකයෙකුගේ ධූර කාලය වසර තුනක් වුවදශ්‍රී ලංකා පොලීසියට 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලබා දී තිබූ නිර්දේශවලින් ක්‍රියාත්මක නොවූ නිර්දේශ 37 ක් සඳහා නිර්දේශ ලබාදීමේදී වසර තුනකට අධික කාලයක් ගත වී තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශය

කොමිෂන් සභාව විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව නිර්දේශ 90 ක් ලබා දී තිබුණු අතර ඉන් නිර්දේශ 36 ක් ක්‍රියාත්මක වී නොතිබුණි.. ක්‍රියාත්මක නොවූ නිර්දේශ ලබා දීම සඳහා කොමිෂන් සභාව විසින් ගත කර තිබූ කාලය අවමය මාස 06 ක් වූ අතර උපරිමය වසර 03 කට වැඩි විය.විස්තර පහත පරිදි විය.

| කාල පරිච්ඡේදය | පැමිණිලි සංඛ්‍යාව | % |
|---|---|---|
| මාස 06 ට අඩු | 5 | 12 |
| මාස 6-12 අතර | 16 | 38 |
| වසර 1-2 අතර | 10 | 24 |
| වසර 2-3 අතර | 1 | 2 |
| වසර 3ට වැඩි | 4 | 10 |




කොමිෂන් සභාව විසින් ඉහත කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව ලබා දී තිබුණු ක්‍රියාත්මක නොවූ නිර්දේශ 36 න් නිර්දේශ 34 ක් පාසැල් වලට සිසුන් ඇතුල් කිරීමට අදාල නිර්දේශ විය.ක්‍රියාත්මක නොවූ නිර්දේශ 36 ලබාදීම සඳහා මාස හයකට අධික කාලයක් ගත කර තිබුණි. පාසැල්වලට සිසුන් ඇතුලත් කිරීමේ කාර්යය ඉතා කඩිනමින් සිදුකල යුතු වන බැවින් එම කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් මාස හයකට අධික කාලයක් වැය කිරීමෙන් හා නිර්දේශ 03 ක් ලබාදීම සඳහා වර්ෂ තුනකට අධික අසාමාන්‍ය කාලයක් ගත කිරීම නිසා පැමිණිලිකාර පාර්ශවයට (අදාල සිසුන්ට) විශාල අසාධාරණයක් සිදු වන බව නිරීක්ෂණය විය.

(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල කොමිෂන් සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව නිර්දේශ 07 ක් ලබා දී තිබූ අතර ඉන් නිර්දේශ 06 ක් ක්‍රියාත්මක වී නොතිබුණි. මෙම පැමිණිලි විභාග කිරීම සඳහා කොමිෂන් සභාව විසින් වසරකට වැඩි කාලයක් වැය කර තිබුණු අතර එක් පැමිණිල්ලක් විමර්ශනය කිරීම සඳහා වසර තුනකට අධික කාලයක් ගත කර තිබූ බවද නිරීක්ෂණය විය.

### 3.2.5. කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශවල ප්‍රගතිය

2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ 147 ක් ලබා දී තිබූ අතර 2019 ඔක්තෝබර් 01 දින වන විට ඉන් නිර්දේශ 87 ක් ක්‍රියාත්මක වී නොතිබුණි. කොමිෂන් සභාව විසින් ලබා දී තිබූ නිර්දේශ ක්‍රියාත්මක නොවීම සඳහා බලපා තිබූ හේතූන් පහත පරිදි විය.

(අ) නිර්දේශය තුල ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් නොකිරීම.

කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ තුල එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ඇතුලත් කර නොතිබුණි. විශේෂයෙන් ශ්‍රී ලංකා පොලීසිය සම්බන්ධයෙන් ලබා දී තිබූ නිර්දේශ තුල මෙකී ගැටළුව උද්ගතව තිබුණි. කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ වන්දි මුදල ගෙවීම කල යුත්තේ කවුරුන් විසින්ද, සමූහයක් විසින් වගකිව යුතු කරුණකදී අදාල වන්දි මුදල ගෙවීම් කිරීම පාර්ශවයන් අතර බෙදී යන ආකාරය, වන්දි මුදල් ගෙවීම සිදු කල යුතු ආකාරය (මුදලින්ද, මුදල් ඇණවුම් මඟින්ද) කවර පාර්ශවයක් ඉදිරියේ ගෙවීම් කල යුතුද ආදී ගැටළු සහිතව නිර්දේශ නිකුත් කර තිබුණි.

(ආ) නිර්දේශ යොමු කිරීම

කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන නිර්දේශ අදාල පාර්ශවයන් වෙත නිසිපරිදි විධිමත් ආකාරයෙන් යොමු කර නොතිබුණු අවස්ථා විය. රජයේ නිලධාරියෙකු දැනුවත් කිරිමේදී ආයතන ප්‍රධානියා හරහා දැනුවත් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ආයතන ප්‍රධානියා දැනුවත් කිරීමකින් තොරව නිලධාරීන් වෙත නිර්දේශ නිකුත් කර තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අනෙකුත් ආයතනික නීතිරීතිවල බලපෑම

කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබාදීමේදී ඒ ඒ ආයතනික නීතිරීති වලට අනුගත වන පරිදි නිර්දේශ ලබා දිය යුතු වුවද එසේ නොකර නිර්දේශ ලබා දී තිබූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.නිදසුන් ලෙස විශ්‍රාම වැටුප් ලබාදීමට කොමිෂන් සභාව නිර්දේශ කර තිබූ අවස්ථාවලදී විශ්‍රාම වැටුප් ආඥාපනතේ විධිවිධාන හා චක්‍ර ලේඛ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් ලබා දීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. විදුහල්වලට දරුවන් ඇතුලත් කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කර ඇතත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්ණායක අනුව දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමට නොහැකි වීතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබාදීමේදි ඊට අදාල සමගාමී පරීක්ෂණ සිදු කරන ආයතනවල තීරණ සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම.

කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබාදීමේදි ඊට අදාල සමගාමී පරීක්ෂණ සිදු කරන අනෙකුත් ආයතන විසින් සිදු කරනු ලබන පරික්ෂණ හා ලබා දෙන තීරණ සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම හේතුවෙන් එම ආයතන විසින් ලබා දෙන තීරණ සහ කොමිෂන් සභාවේ නිර්දේශ අතර පරස්පර බවක් උද්ගතව තිබුණි.

## 04. විගණන නිර්දේශ

(අ) කාර්ය මණ්ඩලය සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම

(ආ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත අනුව ක්‍රියාත්මක වේ. එකී පනතේ කොමිෂන් සභාවෙන් දෙනු ලබන නිර්දේශ වගඋත්තරකාර පාර්ශවය ක්‍රියාත්මක කළ යුතු බවට විධිවිධාන අන්තර්ගත වී නොමැත. එය වගඋත්තරකාර පාර්ශවයන්ට නිර්දේශ ක්‍රියාත්මක නොකර සිටීමට රුකුලක් වී ඇත. කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්මේ (2017 – 2019) පනතේ දුර්වලතා පිළිබඳව දක්වා ඇතත් 1996 සිට මේ දක්වාම මෙම පනතට කිසිදු සංශෝධනයක් සිදු නොකිරීමද නිර්දේශ ක්‍රියාත්මක නොවීම සඳහා බලපා තිබුණි.ඒ අනුව පනත සංශෝධනය කිරීම සඳහා අවධානය යොමු කිරීම සුදුසු වේ.

(ඇ) 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වන වගන්තිය අනුව කොමිෂන් සභාව විසින්, වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවේ අදාල වර්ෂයේ කොමිෂන් සභාවේ සියළු කටයුතු පිළිබඳව තොරතුරු ඇතුළත් කළ යුතුය. තවද කොමිෂන් සභාව වෙත යොමු කරන ලද සියළු කාරණාවල ලැයිස්තුවක්ද,ඒ

කාරණා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගද ඒ එක් එක් කාරණය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශද ඒ වාර්තාවේ ඇතුළත් විය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂ 03 ක වාර්ෂික වාර්තා 2019 ඔක්තෝබර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. කොමිෂන් සභාව විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව සෑම වර්ෂයකදීම නියමිත දිනට වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වේ.

(ඇ) කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය ඉටුකිරීමෙහිලා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ආයතනය සතු නොවීම ප්‍රධානතම ගැටළුව වී ඇත. විශේෂයෙන් පැමිණිලි විමර්ශනය කිරීමේදී එකී කාර්යයට දිගු කාලයක් ගත වීමට ප්‍රධානම හේතුව ලෙස මෙම ආයතනයේ පවතින මානව සම්පත් හිගය දැක්විය හැකිය. ඒ අනුව කොමිෂන් සභාව විසින් නොපමාව විධිමත් පරිදි අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ.

(ඉ) ලබා දෙනු ලබන නිර්දේශ පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයන් වෙත දැනුම් දීමේදී සෑම විටම අදාල ආයතන ප්‍රධානියා හරහා සිදු කිරීම තුලින් නිර්දේශ සම්බන්ධව පසු විපරම් ක්‍රියාවලිය පහසු කර වීමට කටයුතු කිරීම.

(ඊ) නිර්දේශ ලබා දීමෙන් පසු එකී නිර්දේශ පිළිබඳ පසු විපරම් කිරීම ඉතාමත් අඩු මට්ටමක පවතී.කොමිෂන් සභාව විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක වීම පිළිබඳව මෙන්ම නිර්දේශ ක්‍රියාත්මක නොවීම් පිළිබඳවපැමිණිලිකාර පාර්ශවයන් විසින් කරනු ලබන දැනුවත් කිරීම් සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් වෙත ප්‍රතිචාර දැක්වීම කෙරෙහිද කොමිෂන් සභාවේ අවධානය යොමුවිය යුතු වේ.

(උ) පාසැල් සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීමේදී ඒ සම්බන්ධයෙන් සෑම විටම අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර කටයුතු කිරීම.

(ඌ) පළමු වන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීමේදී සෑම විටම පළමු පාසැල්වාරය අවසන් වීමට ප්‍රථමවත් , අදාල විමර්ශන කටයුතු අවසන් කර නිර්දේශ ලබාදීම තුලින් සිසුන් වෙත වඩාත් සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කිරීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති
2020 ඔක්තෝබර් දින

උපලේඛන 01

පුරප්පාඩු පවතින තනතුරු වල අනුමත , තත්‍ය හා පුරප්පාඩු පිළිබඳ විස්තර

| | අනුමත සේවකසංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | පුරප්පාඩු කාල සීමාව |
|---|---|---|---|---|
| අතිරේක ලේකම් | 01 | - | 01 | 2015.02.013 – 2019.11.06 |
| අධ්‍යක්ෂක (පාලන) | 01 | - | 01 | 2018.01.05-2019.11.06 |
| අධ්‍යක්ෂක (පරීක්ෂණ හා විමර්ශන) | 01 | - | 01 | 2012.02.01-2019.11.06 |
| අධ්‍යක්ෂක (පර්යේෂණ හා පාලන ) | 01 | - | 01 | 2014.09.01-2019.11.06 |
| අධ්‍යක්ෂක ( අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් ) | 01 | - | 01 | 2015.04.24-2019.11.06 |
| අධ්‍යක්ෂ ( ජාත්‍යන්තර සබඳතා) | 01 | - | 01 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| සහකාර අධ්‍යක්ෂක | 03 | - | 03 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| නීති නිලධාරි | 22 | 01 | 21 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| ප්‍රාදේශීය සම්බන්ධීකාරක | 10 | 07 | 03 | 2014.10.01-2019.11.06<br>2013.02.07-2019.11.06<br>2019.07.31-2019.11.06 |
| අභ්‍යන්තර විගණක | 01 | - | 01 | 2017.01.22-2019.11.06 |
| ගණකාධිකාරි | 01 | - | 01 | 12019.06.01-2019.11.06 |
| ගිණුම් නිලධාරි | 01 | - | 01 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| පුහුණු හා අධ්‍යාපන නිලධාරි | 01 | - | 01 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| පුස්තකාලාධිපති | 01 | - | 01 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි | 05 | - | 05 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| මානව හිමිකම් නිලධාරි | 47 | - | 47 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| භාෂා පරිවර්ථක | 02 | - | 02 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| පර්යේෂණ සහකාර | 01 | - | 01 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| වැඩ සටහන් සහකාර | 01 | - | 01 | 2011.12.01-2019.11.06 |
| තාක්ෂණ නිලධාරි (දෘඩාංග/මෘදුකාංග) | 02 | - | 02 | තනතුරු ඇති කළද බඳවා ගෙන නොමැත |
| රියදුරු | 14 | 12 | 02 | 2018.12.09-2019.11.06<br>2015.02.25-2019.11.06 |
| | 118 | 20 | 98 | |

**උපලේඛන 02**

පැමිණිලි පිළිබඳ විස්තර

| | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ ඉතිරි පැමිණිලි සංඛ්‍යාව (2015 වර්ෂයේ පමණක් ලද) | | 3576 | | 5750 | | 10241 |
| කොමිෂන් සභාවට ලද පැමිණිලි සංඛ්‍යාව | | **4970** | | **7712** | | **3389** |
| කොමිෂන් සභාවේ විෂය පථයට අදාල නොවීම නිසා ඉවත් කළ පැමිණිලි සංඛ්‍යාව | 1786 | | 1333 | | 1896 | |
| පැමිණිලිකරු පැමිණිල්ල පිළිබඳව උනන්දුවක් නොදැක්වීම නිසා ඉවත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 132 | | 712 | | 1271 | |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී නොමැති නිසා ඉවත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 196 | | 135 | | 315 | |
| වෙනත් හේතූන් මත නවතා දමන ලද පැමිණිලි සංඛ්‍යාව | 300 | | 391 | | 831 | |
| ඉවත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | --------<br>**2414** | | ---------<br>**2571** | | ---------<br>**4313** | |
| නිර්දේශ ලබා දෙන ලද පැමිණිලි සංඛ්‍යාව | 41 | | 84 | | 95 | |
| සමථයකට පත් කිරීම සඳහා අධිකරණ හා වෙනත් බලධාරීන් වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 71 | | 25 | | 81 | |
| පැමිණිලිකරුවන් විසින් ඉවත් කර ගන්නා ලද පැමිණිලි සංඛ්‍යාව | 187 | | 346 | | 175 | |
| සමථයකට පත්කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 83 | | 195 | | 114 | |
| වර්ෂය අවසානයේ ඉතිරිව ඇති පැමිණිලි සංඛ්‍යාව | --------- | (2796)<br>---------<br>5750<br>===== | --------- | (3221)<br>---------<br>10241<br>===== | ---------- | (4778)<br>---------<br>8852<br>===== |